ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

# ප්‍රසම්පාදන දැන්වීම

## කැලෑ සලාක/අතුරු සලාක මලු සඳහා අවැසි සලාක ද්‍රව්‍ය හා සත්ව ආහාර (DOG FOOD) මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කැඳවීම - 2021

1. 2021 ජනවාරි මස 01 දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් ස්ථානයන්හි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය කැලෑ සලාක/අතුරු සලාක මලු සඳහා අවැසි සලාක ද්‍රව්‍ය හා සත්ව ආහාර (Dog Food) මිලදී ගැනීම සඳහා කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ප්‍රසම්පාදන කැඳවනු ලැබේ. ප්‍රසම්පාදන අයදුම්පත් **2020 දෙසැම්බර් මස 07** වන දින **0900 පැය** දක්වා පමණක් නිකුත් කරනු ලබන අතර, මිල ගණන් පත් භාරගැනීම **2020 දෙසැම්බර් මස 08** වන දින **1000 පැයට** අවසන් වේ. ඉන් අනතුරුව එම මිල ගණන් පත් විවෘත කිරීම සිදුකරනු ලබන බැවින් එම අවස්ථාවේ දී අයදුම්කරු හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද අනුමත නියෝජිතයෙකු හට සහභාගී විය හැකිය.

2. ප්‍රසම්පාදන කැඳවනු ලබන කඳවුරු පහත දක්වා ඇත.
   - අ. කොළඹ
   - ආ. පනාගොඩ
   - ඇ. අනුරාධපුරය
   - ඈ. හිඟුරක්ගොඩ
   - ඉ. කන්කසන්තුරය
   - ඊ. මුලතිව්
   - උ. කිලිනොච්චිය
   - ඌ. දියතලාව

3. ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගැනීම සඳහා එක් කඳවුරක් වෙනුවෙන් සත්ව ආහාර (Dog Food) සඳහා රු.3,500.00 ක ආපසු නොගෙවනු ලබන මුදලක් ද, අනෙකුත් සලාක ද්‍රව්‍ය වෙනුවෙන් එක් කඳවුරක් සඳහා රු.1,000.00 ක ආපසු නොගෙවනු ලබන මුදලක් ද, ප්‍රසම්පාදන අයදුම්පත් ගාස්තුවක් වශයෙන් කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, යුද්ධ හමුදා මූලස්ථානයෙහි පිහිටි අධ්‍යක්ෂ - මුදල් වෙත තැන්පත් කළ යුතුය. (චෙක්පත් භාරගනු නොලැබේ.) එම මුදල් තැන්පත් කිරීම වෙනුවෙන් නිකුත් කරන රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, යුද්ධ හමුදා මූලස්ථානයෙහි සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ප්‍රසම්පාදන අයදුම්පත ලබාගත හැකිය.

4. ප්‍රසම්පාදන බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ **"කැලෑ සලාක/අතුරු සලාක මලු සඳහා අවැසි සලාක ද්‍රව්‍ය හා සත්ව ආහාර සැපයීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2021 වසර"** යනුවෙන් සඳහන් කර මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් සභාපති, යුද්ධ හමුදා ප්‍රසම්පාදන කමිටුව, උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ වෙත එවීමට හෝ ප්‍රසම්පාදන කමිටු සභාපති, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ යන ලිපිනය වෙත පැමිණ එහි තබා ඇති දේශීය මිල දී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදන බහාලනයට යොමු කළ හැකිය.

5. අයදුම්කරුවන් විසින් ප්‍රසම්පාදන මිල ගණන් සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.
   - අ. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය. (සහතික කරන ලද ඡායාස්ථ පිටපතක්)
   - ආ. ඉල්ලුම්කරු විසින් පවත්වාගෙන යන බැංකු ගිණුමකට අදාළ බැංකු ප්‍රකාශය.
   - ඇ. ද්‍රව්‍ය සැපයීම සනාථ කිරීම සඳහා පිළිගත හැකි සහතික ඉදිරිපත් කළ යුතුය.
   - ඈ. කොන්ත්‍රාත්කරු විසින් රජයේ හෝ රජයට සම්බන්ධ කිසිදු රැකියාවක් නොකරන බවට තහවුරු කරමින් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.
   - ඉ. ඉල්ලුම්කරුගේ වත්කම් හා මුදල් ස්ථාවරත්වය සනාථ කරනු වස් පළාතේ දිසා ලේකම්/ ප්‍රාදේශීය ලේකම් විසින් නියමිත ආකෘති පත්‍රය (පොදු 170) මඟින් එක් එක් ස්ථානය සඳහා රු. 200,000.00 කට නොඅඩු වත්කම් සහතිකයක් ඉදිරිපත් කළයුතු අතර, එම සහතිකය ප්‍රසම්පාදන භාරගන්නා අවසාන දිනට දින 30 ක් නොඉක්ම විය යුතුය.

6. ඉල්ලුම්කරුවන් විසින් ප්‍රසම්පාදන අයදුම්පත ඉල්ලා සිටීමේ දී සලාක සැපයීම සඳහා ඉල්ලුම් කරනු ලබන කඳවුර සඳහන් කළ යුතුය.

7. අයදුම්කරුවන් විසින් සලාක සැපයීම සඳහා වෙනත් පාර්ශ්වයකට පවරන්නේ නම්/ පැවරීමට අදහස් කරන්නේ නම් එම අයවළුන්ගේ (අනු කොන්ත්‍රාත්කරුවන්ගේ) විස්තර ද ඒ ඒ අයදුම් කරනු ලබන ස්ථාන අනුව සඳහන් කළ යුතුය.

8. අදාළ අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ඇත.

9. ප්‍රසම්පාදන පත්‍රිකා මුදල් ගෙවීමකින් තොරව කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, යුද්ධ හමුදා මූලස්ථානයේ, සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ දී රජයේ වැඩ කරන වේලාවන් තුළ දී පමණක් පරීක්ෂාකර බැලිය හැක.

10. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වැඩි විස්තර කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, යුද්ධ හමුදා මූලස්ථානයෙහි සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාගත හැක.
    දුරකථන අංක : 011 2302568, 011 2302569

**යුද්ධ හමුදාධිපති**
**ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය**
**ශ්‍රී ජයවර්ධනපුර**
**කොළඹ**